අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, පෙරහුරු පරීක්ෂණය- 2025
General Certificate of Education (Adv. Level) Examination, Practice Question Paper 2025

ආර්ථික විද්‍යාව I, Economic I

පැය දෙකයි, Two hours

**උපදෙස් :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පහත ප්‍රකාශ අතරින් සූක්ෂ්ම ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී ප්‍රකාශය වන්නේ,
   (1) පාරිභෝගික ආදායම හා බාල භාණ්ඩයක ඉල්ලුම අතර ප්‍රතිලෝම සබඳතාවක් පවතී.
   (2) මුදල් සැපයුම හා පොළී අනුපාතය අතර ප්‍රතිලෝම සබඳතාවක් පවතී.
   (3) ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්තිය අතර අනුලෝම සබඳතාවක් පවතී.
   (4) දරිද්‍රතා අනුපාතිකය පහළ දැමීමට උද්ධමන අනුපාතිකය 5% ට වඩා අඩු කළ යුතුය.
   (5) ඉහළ මානව සංවර්ධනයක් අත් කර ගැනීමට නම් දිළිඳුකම තුරන් කළ යුතු වේ.

2. ආර්ථික <u>නොවන</u> භාණ්ඩවලට පමණක් අනන්‍ය ලක්ෂණය කුමක් ද?
   (1) හිඟ සම්පත් භාවිත කරමින් නිපදවා තිබීම ය.
   (2) ස්වාභාවික සම්පත් යොදා ගනිමින් නිපදවා තිබීම ය.
   (3) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් පමණක් භාවිතයෙන් නිපදවා තිබීම ය.
   (4) ශුන්‍ය මිලක් යටතේ ආවස්ථික පිරිවැයකින් තොරව භාවිත කළ හැකි වීම ය.
   (5) මිනිස් වුවමනා තෘප්තිමත් කර ගැනීමට යොදා ගත හැකි වීම ය.

3. නිෂ්පාදන ගැටලුව, වෙළෙඳපොළ ආර්ථිකයක් විසින් විසඳනු ලබන්නේ,
   (1) භාණ්ඩ වෙළෙඳපොළ මිල සංඥා වෙත ප්‍රතිචාර දැක්වීම මගිනි.
   (2) සාධක වෙළෙඳපොළ මිල සංඥා වෙත ප්‍රතිචාර දැක්වීම මගිනි.
   (3) සමාජ සුභසාධනය උපරිම කිරීමට ප්‍රතිචාර දැක්වීම මගිනි.
   (4) පූර්ණ සේවා නියුක්තිය ඇතිකිරීමට ප්‍රතිචාර දැක්වීම මගිනි.
   (5) රජය නියාමනය කරන ලද මිල යාන්ත්‍රණයට ප්‍රතිචාර දැක්වීම මගිනි.

4. ආහාර හා ඇඟළුම් නිෂ්පාදනයේ නිරත ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත වූ නිෂ්පාදන සංයෝගය,වක්‍රයෙන් ඇතුළට විතැන් වීමකට හේතු විය හැකි සිදුවීම වනුයේ,
   (1) ආර්ථිකයේ නිෂ්පාදන තාක්ෂණය පෙරට වඩා දියුණු වීම.
   (2) ඇඟළුම් කර්මාන්තය වෙතින් ආහාර නිෂ්පාදන කර්මාන්තය වෙත සම්පත් මාරු කිරිම.
   (3) ආර්ථිකයේ පුහුණු ශ්‍රමිකයන් විශාල පිරිසක් විදේශ කරා සංක්‍රමණය වීම.
   (4) අමු ද්‍රව්‍ය හිඟ වීම නිසා දිනකට පැය කිහිපයක් කර්මාන්ත ශාලා වසා තැබීම .
   (5) ඉල්ලුම ඉහළ යාම නිසා ආර්ථිකයේ සම්පත් සම්භාරය අධි ධාරිතාවයකින් උපයෝජනය කිරීම.

5. වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වම් පසට විතැන් වීමට හේතුවක් වන්නේ,
   (1) සලකා බලන භාණ්ඩයේ මිල ඉහළ යාම. (2) පාරිභෝගික ආදායම ඉහළ යාම.
   (3) ආදේශන භාණ්ඩවල මිල ඉහළ යාම. (4) අනුපූරක භාණ්ඩවල මිල ඉහළ යාම.
   (5) සලකා බලන භාණ්ඩයේ මිල අනාගතයේ ඉහළ යතැ’යි අපේක්ෂා කිරීම.

6. වෙළෙඳපොළෙහි අලෙවි වන එක්තරා භාණ්ඩයක මිල රුපියල් 20 දී ඒකක 1000ක් ඉල්ලුම් කරනු ලබන අතර, එම මිල යටතේ මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය - 0.5 ක් විය. මෙම භාණ්ඩයේ මිල රුපියල් 22ක් වුවහොත් වෙළෙඳපොළ ඉල්ලුම් ප්‍රමාණය කොපමණ වේ ද?
   (1) ඒකක 995 කි. (2) ඒකක 975 කි. (3) ඒකක 950 කි.
   (4) ඒකක 900 කි. (5) ඒකක 500 කි.

7. X භාණ්ඩය සඳහා Y භාණ්ඩය සමීපත ම ආදේශක භාණ්ඩයක් වේ නම්,
   (1) X හා Y භාණ්ඩ දෙකෙහි මිල ඉල්ලුම් නම්‍යතා සංගුණක ශුන්‍යයට ආසන්න ධන අගයක් ගනී.
   (2) X හා Y භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ශුන්‍යයට ආසන්න ඍණ අගයක් ගනී.
   (3) X හා Y භාණ්ඩ දෙකෙහි ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණක ශුන්‍යයට ආසන්න ධන අගයක් ගනී.
   (4) X හා Y භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය ශුන්‍යයට ආසන්න ධන අගයක් ගනී.
   (5) X හා Y භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය 1 ට වැඩි ධන අගයක් ගනී.

8. වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ධන බෑවුමක් ගනු ලැබීමට බලපාන **ප්‍රබලතම** හේතුව වනුයේ,
   (1) නිමැවුම ප්‍රසාරණය කිරීමේ දී ආවස්ථික පිරිවැය ඉහළ නැගීම ය.
   (2) විචල්‍ය යෙදවුම් ප්‍රසාරණය කිරීමේ දී සාමාන්‍ය ඵලදායිතාව හීන වීම ය.
   (3) නිමැවුම ප්‍රසාරණය කිරීමේ දී ආන්තික පිරිවැය ඉහළ යාම ය.
   (4) විචල්‍ය යෙදවුම් ප්‍රසාරණයේ දී ආන්තික ඵලදායිතාව ඉහළ යාම ය.
   (5) තාක්ෂණයේ දියුණුව සමග නිෂ්පාදන පිරිවැය පහළ යාම ය.

9. A භාණ්ඩය සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රයේ සමීකරණය $QS_A$ = - 80 + 2 P වන අතර, B භාණ්ඩය සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රයේ සමීකරණය $QS_B$ = 50+3P වේ. මෙම භාණ්ඩ දෙකෙහි මිල ඉහළ යාම සමග සැපයුම් නම්‍යතා සංගුණකය වෙනස් වන ආකාර නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?


| | A භාණ්ඩයේ සැපයුම් නම්‍යතා සංගුණකය | B භාණ්ඩයේ සැපයුම් නම්‍යතා සංගුණකය |
|---|---|---|
| (1) | අඩු වේ | වැඩි වේ |
| (2) | වැඩි වේ | අඩු වේ |
| (3) | වැඩි වේ | වැඩි වේ |
| (4) | අඩු වේ | අඩු වේ |
| (5) | අඩු වේ | ස්ථාවර වේ |

10. තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම් වක්‍රය අනම්‍ය වූ අතර, සැපයුම් වක්‍රය නම්‍ය තත්ත්වයක තිබී පසුව අනම්‍ය තත්ත්වයක් දක්වා විතැන් විය. මෙහි ප්‍රතිඵලය ලෙස සමතුලිත මිල හා පාරිභෝගික අතිරික්තය වෙනස් වන ආකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | සමතුලිත මිල | පාරිභෝගික අතිරික්තය |
|---|---|---|
| (1) | ඉහළ යයි | පහළ යයි |
| (2) | පහළ යයි | ඉහළ යයි |
| (3) | පහළ යයි | පහළ යයි |
| (4) | ඉහළ යයි | ඉහළ යයි |
| (5) | පහළ යයි | වෙනස් නොවේ |

11. තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයක් සඳහා වූ ආදේශන භාණ්ඩවල මිල පහළ ගිය අතර, එම භාණ්ඩයේ නිෂ්පාදන පිරිවැය ද පහළ යන ලදී. මෙම සිදුවීමෙන් පසු භාණ්ඩයේ,
   (1) සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.
   (2) සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය පහළ යයි.
   (3) සමතුලිත මිල ඉහළ ගොස් සමතුලිත ප්‍රමාණය පහළ යයි.
   (4) සමතුලිත මිල පහළ ගොස් සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.
   (5) සමතුලිත මිල අවශ්‍යයෙන් ම පහළ යන අතර සමතුලිත ප්‍රමාණයේ වෙනස් වීම අවිනිශ්චිතයි.

12. තිරිඟු පිටි සඳහා රජය රුපියල් 10 ක ඒකක සහනාධාරයක් නිෂ්පාදකයා වෙත ලබාදුන් පසු වෙළෙඳපොළ සමතුලිතයේ සිදුවන වෙනස්වීම පහත රූප සටහනෙහි දැක්වේ. සහනාධාරයෙන් පසු නිෂ්පාදක අතිරික්තය, සහනාධාරයෙන් නිෂ්පාදකයාට ලැබෙන ප්‍රතිලාභය සහ අහිමි වන සුබසාධනය නිවැරදිව පෙළගැස් වූ පිළිතුර කුමක් ද?




| | නිෂ්පාදක අතිරික්තය | නිෂ්පාදකයාට ලැබෙන ප්‍රතිලාභය | අහිමිවන සුබ සාධනය |
|---|---|---|---|
| (1) | 3125 | 1250 | 250 |
| (2) | 3125 | 2500 | 250 |
| (3) | 4000 | 1250 | 500 |
| (4) | 4000 | 1125 | 250 |
| (5) | 6000 | 1250 | 250 |

13. තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරන භාණ්ඩයක් සඳහා අවම මිලක් නියම කොට, අතිරික්ත සැපයුම රජය විසින් වී මිල දී ගනු ලැබුව හොත් වෙළෙඳපොළ තුළ සිදුවීමට ඉඩක් **නොමැති** සිදුවීම වනුයේ,

(1) නිෂ්පාදක අතිරික්තය ඉහළ යාම.
(2) පාරිභෝගික අතිරික්තය ඉහළ යාම.
(3) ගැනුම්කරු ගෙවන මිල ඉහළ යාම ය.
(4) සමාජ සුබ සාධනය පහළ යාම ය.
(5) අධි නිෂ්පාදනයක් ඇති වීම ය.

14. රජය විසින් භාණ්ඩ මත බදු අය කිරීමේ දී වැඩි බදු බරක් පාරිභෝගිකයින්ට දැරීමට සිදුවන්නේ කුමන ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන් සහිත භාණ්ඩයක් මත බදු පැනවූ විට ද?

| | ඉල්ලුම් නම්‍යතාව | සැපයුම් නම්‍යතාව |
|---|---|---|
| (1) | අනම්‍ය | නම්‍ය |
| (2) | ඒකීය නම්‍ය | ඒකීය නම්‍ය |
| (3) | නම්‍ය | අනම්‍ය |
| (4) | ඒකීය නම්‍ය | අනම්‍ය |
| (5) | පූර්ණ නම්‍ය | පූර්ණ අනම්‍ය |

15. ආයතනයක් තම නිෂ්පාදන ක්‍රියාවලියේ දී හීනවන ආන්තික ඵල නීතියට මුහුණ දෙනු ලැබේ නම්, විචල්‍ය යෙදවුම් වැඩියෙන් භාවිත කරන විට සාමාන්‍ය ඵලදායීතාව උපරිම වීමෙන් අනතුරුව පහත සඳහන් කුමක් සිදු විය හැකි ද?

(1) ආන්තික පිරිවැය අවම වේ.
(2) සාමාන්‍ය විචල්‍ය පිරිවැය අඩු වේ.
(3) ආන්තික ඵලදාව වැඩිවේ.
(4) ආන්තික පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉහළ යයි.
(5) ආන්තික පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ යයි.

16. නිෂ්පාදන ආයතනයකට අදාළ පිරිවැය පිළිබඳ දත්ත පහත වගුවේ දැක්වේ.

| නිමවුම (ඒකක) | මුළු පිරිවැය (රු.) | ආන්තික පිරිවැය(රු.) |
|---|---|---|
| 1 | 200 | 50 |
| 2 | 230 | 30 |
| 3 | 250 | 20 |
| 4 | 275 | 25 |

ඉහත තොරතුරු අනුව නිමවුම් ඒකක 2 දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය වනුයේ,

(1) රු. 15 කි. (2) රු. 30 කි. (3) රු. 40 කි. (4) රු. 50 කි. රු. 90 කි.

17. කතිපයාධිකාරි වෙළෙඳපොළක් තුළ දැකිය හැකි ලක්ෂණයක් වනුයේ,
    (1) සමජාතීය නිෂ්පාදනයන් පමණක් තිබීම ය.
    (2) වෙළෙඳපොළට අබාධව පිවිසීමට හා පිටවීමට හැකි වීම ය.
    (3) ආයතන, පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දීම ය.
    (4) ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතීම ය.
    (5) ආයතන දිගු කාලීන වශයෙන් ප්‍රාමාණික ලාභ ඉපැයීම ය.

18. පූර්ණ තරගකාරී කර්මාන්තයක කටයුතු කරන ආයතනයක් කෙටි කාලයක් තුළ දී පහත සඳහන් තත්ත්වයන්ට මුහුණ පා සිටී.

| | | |
|---|---|---|
| නිමවුම් මට්ටම | = | ඒකක 5000 |
| ඒකකයක වෙළෙඳපොළ මිල | = | රු. 5 |
| මුළු ස්ථාවර පිරිවැය | = | රු.10 000 |
| මුළු පිරිවැය | = | රු.40 000 |
| ඒකක 500 දී ආන්තික පිරිවැය | = | රු.5 |

ලාභ උපරිම කිරීමේ අරමුණින් කටයුතු කරන මෙම ආයතනය ගත යුතු වඩාත් තාර්කික තීරණය වනුයේ,
(1) නිමවුම් ප්‍රමාණය අඩු කොට නිෂ්පාදනයේ යෙදීම ය. (2) භාණ්ඩයේ මිල ඉහළ නැංවීම ය.
(3) නිමැවුම් ප්‍රමාණය ඉහළ නැංවීම ය. (4) ආයතනය කර්මාන්තයෙන් ඉවත් වීම ය.
(5) නිමැවුම් ප්‍රමාණය නොවෙනස්ව පවත්වා ගැනීම ය.

19. එක්තරා ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු සංඛ්‍යා රුපියල් මිලියනවලිනි)

| | | |
|---|---|---|
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | = | 800 |
| පෞද්ගලික පරිභෝජන වියදම | = | 1200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | = | 250 |
| රජයේ පරිභෝජන වියදම | = | 2400 |
| භාණ්ඩ හා සේවා මත පැන වූ ශුද්ධ බදු | = | 400 |
| ශුද්ධ අපනයන | = | -500 |

ඉහත දත්තවලට අනුව වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම වනුයේ,
(1) රු. මිලියන 3900 කි. (2) රු. මිලියන 4650 කි. (3) රු. මිලියන 4900 කි.
(4) රු. මිලියන 5050 කි. (5) රු. මිලියන 5150 කි.

20. පහත සඳහන් ප්‍රකාශ අතරින් දළ ජාතික ඉතුරුම් නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වනුයේ,
    (1) දළ ආයෝජනය + ශුද්ධ අපනයනය.
    (2) දළ දේශීය ඉතුරුම් + ශුද්ධ අපනයන.
    (3) දළ දේශීය ඉතුරුම් + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම්.
    (4) දළ ආයෝජනය + ගෙවුම් ශේෂ ලේඛනයේ වර්තන ගිණුමේ ශේෂය.
    (5) දළ ආයෝජනය + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් + ශුද්ධ විදේශ ද්විතීයික ආදායම්.

21. පහත නිෂ්පාදන ක්‍රියාකාරකම් අතරින් ජාතික ගිණුම් ඇස්තමේන්තු කිරීම සඳහා ඇතුළත් **කරන** ක්‍රියාකාරකම වනුයේ,
    (1) පාසල් ළමුන් සඳහා ලබාදෙන පාසල් පොත් මුද්‍රණ වියදම්.
    (2) වනාන්තරවල සිදුවන මී වද වර්ධනය.
    (3) රජයේ සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීම.
    (4) සමාගම්වල කොටස් මිල දී ගැනීම සඳහා දරන වියදම.
    (5) ගෘහණියන් තම නිවෙස්වල වැඩිහිටියන් රැක බලා ගැනීම.

22. දළ නිමවුමේ වටිනාකමෙන් අතරමැදි යෙදවුම්වල වටිනාකම අඩු කළ විට ලබා ගත හැකි වනුයේ,
   (1) සමස්ත එකතු කළ වටිනාකම යි.
   (2) පරිලේඛන වෙනස් වීම යි.
   (3) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය යි.
   (4) වටිනාකම්වල වෙනස් වීම යි.
   (5) ශුද්ධ මෙහෙයුම් අතිරික්තය යි.

23. රජය නොමැති ආවෘත ආර්ථිකයක පරිභෝජන C = 400 + 08yd වේ. මෙම ආර්ථිකය වෙත රජය මැදිහත් වී රු. මිලියන 200 ක ආදායම් බදු අය කිරීම හා රු.මිලියන 60ක සංක්‍රාම ලබා දීම සිදු කළේ නම්, ආර්ථිකයේ ජාතික ආදායම මත ගොඩනගන ලද පරිභෝජන ශ්‍රිතය කුමක් ද?
   (1) C = 540 + 0.8y වේ.
   (2) C = 512 + 0.8y වේ.
   (3) C = 288 + 0.8y වේ.
   (4) C = 260 + 0.8y වේ.
   (5) C = 240 + 0.8y වේ.

24. ආන්තික පාරිභෝජන නැමියාව 0.8ක් වූ සංවෘත ආර්ථිකයක විභව නිමැවුම් මට්ටම 10000 කි. සැබෑ නිමැවුම් මට්ටම 8000 කි. මෙම ආර්ථිකය, විභව නිමැවුම් මට්ටම කරා රැගෙන යාමට වඩාත් යෝග්‍ය වන්නේ කුමන ක්‍රියාමාර්ග සංයෝජනය ද?
   (1) රජයේ මිලදී ගැනීම් 250කින් ඉහළ නැංවීම හා රජය බදු 150කින් පහළ දැමීම.
   (2) රජයේ මිල දී ගැනීම් 240කින් ඉහළ නැංවීම හා රජය බදු 200කින් පහළ දැමීම.
   (3) රජයේ මිල දී ගැනීම් 200කින් ඉහළ නැංවීම හා රජය බදු 240කින් පහළ දැමීම.
   (4) රජයේ මිල දී ගැනීම් 200කින් ඉහළ නැංවීම හා රජය බදු 200කින් පහළ දැමීම.
   (5) රජයේ මිල දී ගැනීම් 200කින් හා රජය බදු 200කින් ඉහළ නැංවීම.

25. පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමේ පවතින ආර්ථිකයක සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වුවහොත්,
   (1) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ ගොස් මිල මට්ටම පහළ යයි .
   (2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවරව තිබියදී මිල මට්ටම ඉහළ යයි.
   (3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ ගොස් මිල මට්ටම ඉහළ යයි.
   (4) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය හා මිල මට්ටම ඉහළ යයි .
   (5) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යන නමුත් මිල මට්ටම ස්ථාවරව පවතී.

26. මුදල් ඉල්ලුම කෙරෙහි ප්‍රතිලෝම බලපෑමක් ඇති කරන මුදල් ඉල්ලුම් තීරකය වනුයේ,
   (1) පොළී අනුපාතිකය යි.
   (2) ආදායම් ලැබීමේ කාල පරතරය යි.
   (3) මූර්ත ජාතික ආදායම යි.
   (4) පොදු මිල මට්ටම යි.
   (5) පිළිණපත්වල වර්තමාන මිල යි.

27. පහත පිළිතුරු අතරින් $M2_b$ මුල්‍ය සමස්තය තුළ ඇතුළත් **නොවන** අයිතමයන් සහිත පිළිතුර වනුයේ,
   (1) මහජනයා සතු ව්‍යවහාර මුදල් හා මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු ය.
   (2) මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති ඉතුරුම් තැන්පතු හා ඉල්ලුම් තැන්පතු ය.
   (3) මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති කාලීන තැන්පතු හා ඉතුරුම් තැන්පතු ය.
   (4) වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් හා වාණිජ බැංකු නමින් මහ බැංකුවේ ඇති සංචිත ය.
   (5) වාණිජ බැංකුවල නේවාසික හා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ය.

28. මුදල් සැපයුම 1000 ක් ද , මිල මට්ටම 10 ක් ද , නාමික දළ දේශීය නිෂ්පාදිතය 5000ක් ද වේ නම් මුදලේ සංසරණ ප්‍රවේගය හා මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පිළිවෙළින්,
   (1) 3 සහ 5000 වේ.
   (2) 5 සහ 500 වේ.
   (3) 10 සහ 5000 වේ.
   (4) 50 සහ 500 වේ.
   (5) 50 සහ 50000 වේ.

29. ආර්ථිකයේ අධි බලැති මුදල් තොගය ඉහළ යාමට බලපාන හේතුවක් වනුයේ,
   (1) මහ බැංකුව වාණිජ බැංකු වෙතින් විදේශ විනිමය මිලදී ගැනීම ය.
   (2) මහ බැංකුව රජය වෙත විදේශ විනිමය විකිණීම ය.
   (3) මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත විදේශ විනිමය විකිණීම ය .
   (4) මහ බැංකුව විසින් රජය වෙත ලබා දී තිබූ ණය ආපසු අය කර ගැනීම ය.
   (5) මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත ලබා දී තිබූ ණය ආපසු අය කර ගැනීම ය .


30. එක්තරා වාණිජ බැංකුවක ශේෂ පත්‍රයෙන් උපුටා ගත් සාරාංශයක් පහත දැක්වේ.

| වගකීම් (රු.මි.) | | වත්කම් (රු.මි.) | |
|---|---|---|---|
| තැන්පතු | 90,000 | සංචිත<br>සුරැකුම්පත්<br>ණය | 12,000<br>30,000<br>48,000 |
| | 90,000 | | 90,000 |

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% නම් මෙම බැංකුවට අලුතින් නිකුත් කළ හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ ද?

(1) රු.2000 කි. (2) රු. 3000 කි. (3) රු. 9000 කි. (4) රු. 10000 කි. රු. 15000 කි.

31. භාණ්ඩයක ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රය, ආන්තික සමාජ පිරිවැය වක්‍රය සහ ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වක්‍රය පහත ප්‍රස්තාර සටහනෙහි දැක්වේ.




ඉහත ප්‍රස්තාර සටහන මගින් නිරූපණය වන්නේ,

(1) නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක් සහිත භාණ්ඩයක සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය වෙළෙඳපොළ නිෂ්පාදනය ඉක්මවා යන බවයි.
(2) පරිභෝජනයේ සෘණ බාහිරතා සහිත භාණ්ඩයක සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය වෙළෙඳපොළ නිෂ්පාදනය ඉක්මවා යන බවයි.
(3) අවගුණ භාණ්ඩයක සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය වෙළෙඳපොළ නිෂ්පාදනය ඉක්මවා යන බවයි.
(4) සමාජ සුබ සාධන භාණ්ඩයක සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය වෙළෙඳපොළ නිෂ්පාදනය ඉක්මවා යයි.
(5) නිෂ්පාදනයේ සෘණ බාහිරතාවන් පවතින භාණ්ඩයක වෙළෙඳපොළ නිෂ්පාදනය සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිෂ්පාදනය ඉක්මවා යයි.

32. බදු මූලධර්ම ලෙස අන්‍යෝන්‍ය ප්‍රතිවිරෝධතාවයක් පවතින්නේ ,
(1) සරල බව හා සාධාරණ බව අතර ය. (2) මධ්‍යස්ථ බව හා සාධාරණ බව අතර ය.
(3) සරල බව හා පිරිමැසුම් බව අතර ය. (4) මධ්‍යස්ථ බව හා පිරිමැසුම් බව අතර ය.
(5) කාර්යක්ෂම බව හා සරල බව අතර ය.

33. එක්තරා ආර්ථිකයක රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳව තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
(සියලු සංඛ්‍යා රුපියල් බිලියනවලිනි)

| | |
|---|---|
| බදු ආදායම | 40,000 |
| බදු නොවන ආදායම | 10,000 |
| ප්‍රදාන | 5,000 |
| වර්තන වියදම් | 59,000 |
| ප්‍රාග්ධන වියදම් | 8,000 |
| ශුද්ධ ණය දීම් | 2,000 |

ඉහත තොරතුරු අනුව මෙම ආර්ථිකයේ වර්තන ගිණුමේ ශේෂය සහ සමස්ත අයවැය ශේෂය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | වර්තන ගිණුමේ ශේෂය (රු.බිලියන) | සමස්ත අයවැය ශේෂය (රු.බිලියන) |
|---|---|---|
| (1) | - 4000 | - 14000 |
| (2) | - 4000 | - 19000 |
| (3) | - 9000 | - 19000 |
| (4) | - 9000 | - 14000 |
| (5) | - 12000 | - 14000 |

34. 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ වර්තන වියදමේ විශාලතම සංරචකය වනුයේ,

(1) පොලී ගෙවීම් සඳහා දරණ වියදම යි.
(2) රාජ්‍ය සේවකයින්ට ගෙවන වැටුප් වියදම යි.
(3) විශ්‍රාම වැටුප් සඳහා දරණ වියදම යි.
(4) වර්තන සංක්‍රාම සඳහා දරණ වියදම යි.
(5) භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට දරණ වියදම යි.

35. 2024 වර්ෂයේ මධ්‍යම රජයේ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස,
(1) 96.1% කි
(2) 100% කි.
(3) 114.2% කි.
(4) 119.6% කි.
(5) 104.7 % කි.

36. ප්‍රංශය හා ජර්මනිය යන දෙරටෙහි සංයුක්ත යෙදවුම් ඒකකයකින් නිපදවිය හැකි තිරිඟු හා කිරිපිටි ඒකක ප්‍රමාණ පහතින් දැක්වේ.

| භාණ්ඩය | ප්‍රංශය | ජර්මනිය |
|---|---|---|
| තිරිඟු (කි.ග්‍රෑ.) | 6 | 4 |
| කිරිපිටි (කි.ග්‍රෑ.) | 2 | 4 |

අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් සිදුවීම සඳහා ජර්මනිය, ප්‍රංශය සමඟ වෙළෙඳාම් කිරීමට කැමති වන්නේ කවර හුවමාරු අනුපාතයක් යටතේ ද?

(1) කිරිපිටි කි.ග්‍රෑ. 1ක් සඳහා තිරිඟු කි.ග්‍රෑ 2 ට වඩා අඩු ප්‍රමාණයක්.
(2) කිරිපිටි කි.ග්‍රෑ. 1ක් සඳහා තිරිඟු කි.ග්‍රෑ 1කට වඩා අඩු ප්‍රමාණයක්.
(3) කිරිපිටි කි.ග්‍රෑ. 1ක් සඳහා තිරිඟු කි.ග්‍රෑ 2ත් 4ත් අතර ප්‍රමාණයක්.
(4) කිරිපිටි කි.ග්‍රෑ 1ක් සඳහා තිරිඟු කි.ග්‍රෑ 1ත් 3ත් අතර ප්‍රමාණයක්.
(5) කිරිපිටි කි.ග්‍රෑ 1ක් සඳහා තිරිඟු කි.ග්‍රෑ 4ට වඩා වැඩි ප්‍රමාණයක්.

37. අර්තාපල් වෙළෙඳපොළ සම්බන්ධ පහත තොරතුරු ඔබට සපයා ඇත.

අර්තාපල් ආනයනය මත තීරු බද්ද 25% කි.
ආනයනික යෙදවුම් මත තිරු බද්ද 20% කි.
අර්තාපල් කිලෝ ග්‍රෑමයක ආනයන මිල රු. 80කි.
අර්තාපල් කිලෝ ග්‍රෑමයක් නිපදවීමට අවශ්‍ය ආනයනික යෙදවුම් පිරිවැය රු. 50කි

ඉහත තොරතුරුවලට අනුව සඵල ආරක්ෂණ අනුපාතිකය කුමක් ද?

(1) 20.00% කි. (2) 33.33% කි. (3) 40.33% කි. (4) 66.66% කි. (5) 80.66% කි.

38. ශ්‍රී ලංකාවේ 2024 වර්ෂයේ වැඩිම අපනයන ආදායමක් ලබා දුන් භාණ්ඩය හා අපනයන ගැණුම්කරු අනුපිළිවෙළින් නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද? ,

(1) තේ සහ ඇමරිකා එක්සත් ජනපදය වේ.
(2) රෙදිපිළි හා ඇඟලුම් සහ එක්සත් රාජධානිය වේ.
(3) රෙදිපිළි හා ඇඟලුම් සහ ඇමරිකා එක්සත් ජනපදය වේ.
(4) තේ සහ එක්සත් රාජධානිය වේ.
(5) ඛණිජ තෙල් නිෂ්පාදන සහ ඉන්දියාව වේ.

39. කිසියම් රටක ගෙවුම් ශේෂ ලේඛනයකින් තෝරාගත් දත්ත කීපයක් පහත දැක්වේ.

| අයිතමය | වටිනාකම (රු.බි.) |
|---|---|
| අපනයන (භාණ්ඩ) | 5000 |
| ආනයන (භාණ්ඩ) | 7000 |
| සේවා (ශුද්ධ) | 300 |
| ප්‍රාථමික ආදායම (ශුද්ධ) | -100 |
| ද්විතීයික ආදායම (ශුද්ධ) | 150 |
| ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ) | 600 |

ඉහත දක්වා ඇති තොරතුරුවලට අනුව මෙම රටේ ගෙවුම් ශේෂ තත්ත්වය පිළිබඳව පහත කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) වෙළෙඳ ගිණුමේ රු.බි. 2000ක අතිරික්තයක් පවතී.
(2) ජංගම ගිණුමේ රු.බි. 2350ක හිඟයක් පවතී.
(3) මූල්‍ය ගිණුමේ රු.බි. 1650ක අතිරික්තයක් පවතී.
(4) මූල්‍ය ගිණුමේ රු.බි. 1050ක හිඟයක් පවතී.
(5) ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ රු.බි. 1050ක හිඟයක් පවතී.


40. වෙළෙඳ අනුපාතයේ අගය අඩුවීමට බලපාන හේතුවක් වන්නේ,

(1) අපනයන මිල ඉහළ යාමට වඩා අඩු වේගයකින් ආනයන මිල ඉහළ යාම.
(2) අපනයන මිල ඉහළ යාම හා ආනයන මිල පහළ යාම එකවර සිදුවීම.
(3) අපනයන මිල ස්ථාවරව තිබියදී ආනයන මිල පහළ යාම.
(4) අපනයන මිල ඉහළ යාමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ඉහළ යාම.
(5) අපනයන මිල හා ආනයන මිල එකම ප්‍රමාණයකින් ඉහළ යාම.

41. තරගකාරීත්ව වාසිය තීරණය කිරීමෙහිලා ප්‍රභේදන වාසි මූලාශ්‍රයට අයත් වන සාධකය වනුයේ,

(1) නිෂ්පාදන ධාරිතාවය පූර්ණ උපයෝජනය. (2) ප්‍රචාරණය.
(3) ඉහළ ඵලදායීතාව. (4) දියුණු තාක්ෂණය භාවිතය.
(5) කාර්යක්ෂම බෙදා හැරීමේ ජාල.

42. පහත දැක්වෙන රූප සටහන මගින් ශ්‍රී ලංකා රුපියලේ අගය එක්සත් ජනපද ඩොලර්වලින් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා රුපියල් සඳහා ඉල්ලුම $D_1$ සිට $D_2$ දක්වා විතැන් වුවහොත් ඇතිවිය හැකි ප්‍රතිවිපාකය කුමක් ද?




(1) ඇමෙරිකානු ආයෝජකයින්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර බිල්පත් වඩා ලාභදායක වනු ඇත.
(2) ඇමෙරිකාවට ආනයනය කරන ශ්‍රී ලංකා භාණ්ඩවලට ගෙවිය යුතු මිල වඩාත් අඩු වනු ඇත.
(3) ශ්‍රී ලාංකිකයන්ට ඇමෙරිකාවේ සංචාරය කිරීම ලාභදායක වනු ඇත.
(4) ශ්‍රී ලංකාවට ඇමෙරිකාවෙන් ආනයනය කරනු ලබන භාණ්ඩවල මිල ඉතා අධික වනු ඇත.
(5) ශ්‍රී ලාංකිකයන්ට ඇමෙරිකාවේ සංචාරය කිරීම අවාසිදායක වනු ඇත.


43. ආර්ථික වෘද්ධිය වඩාත් නිවැරදි ලෙස දැක්වෙන ප්‍රකාශය කුමක් ද?
(1) විභව නිෂ්පාදන හැකියාව ඉහළ යාම ය.
(2) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.
(3) දළ දේශීය නිෂ්පාදිතයේ නාමික වටිනාකම ඉහළ යාම ය.
(4) ඒක පුද්ගල මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.
(5) ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම ඉහළ යාම ය.

44. 2022 වර්ෂයේ මානව සංවර්ධන දර්ශකයේ පහළම අගය සහ ඉහළම අගය හිමිකර ගත් රටවල් අනුපිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) මධ්‍යම අප්‍රිකානු ජනරජය හා අයිස්ලන්තය.
(2) දකුණු සුඩානය හා නෝර්වේ.
(3) දකුණු සුඩානය හා ස්විස්ටර්ලන්තය.
(4) සෝමාලියාව හා නෝර්වේ.
(5) සෝමාලියාව හා ස්විස්ටර්ලන්තය.

45. ලෝක බැංකුව විසින් ඒක පුද්ගල දළ ජාතික ආදායම පදනම් කර ගෙන ලෝකයේ රටවල් කාණ්ඩගත කිරීමේ දී 2024 වර්ෂයේ දී පහළම ආදායම් කාණ්ඩය ලෙස සැළකෙනුයේ ඒක පුද්ගල දළ ජාතික ආදායම ඇමරිකන් ඩොලර් ,
(1) 1085 ට වඩා අඩුවෙන් ලබන රටවල් ය.
(2) 1105 ට වඩා අඩුවෙන් ලබන රටවල් ය.
(3) 1135 ට වඩා අඩුවෙන් ලබන රටවල් ය.
(4) 1145 ට වඩා අඩුවෙන් ලබන රටවල් ය.
(5) 1245 ට වඩා අඩුවෙන් ලබන රටවල් ය.

46. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂයේ සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ජාතික බහුමාන දරිද්‍රතාවයට පත් ජනගහන ප්‍රතිශතය,
(1) 15 % කි
(2) 16 % කි
(3) 17.2% කි
(4) 17.8 % කි
(5) 51.3 % කි

47. පහත දැක්වෙන පරිදි කිසියම් රටක ලෝරන්ස් වක්‍රය 1 සිට 2 තත්ත්වය දක්වා විතැන් විය. ලෝරන්ස් වක්‍රයේ විතැන්වීමට හේතු විය හැකි සිද්ධිය කුමක් ද?




(1) ආණ්ඩුව විසින් ආදායම් මත අනුක්‍රමික බදු අනුපාත ඉහළ දැමීම.
(2) ආණ්ඩුව විසින් ප්‍රතික්‍රමික බදු අනුපාත ක්‍රමය සපුරාම ඉවත් කිරීම.
(3) ආණ්ඩුව, වෙළෙඳපොළ යාන්ත්‍රණය මත නියාමන පුළුල් කිරීම.
(4) ආණ්ඩුව, සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම.
(5) ආණ්ඩුව, සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාකාරීත්වයෙන් ඉවත් වීම.

48. පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක ප්‍රජා විද්‍යාත්මක තොරතුරු කීපයකි.

| වර්ෂය | වැඩකළ හැකි වයසේ ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ජනගහනය (මිලියන) | සේවා වියුක්ත ජනගහනය (මිලියන) |
|---|---|---|---|
| 2023 | 20 | 8 | 2 |
| 2024 | 25 | 9 | 3 |

මෙම තොරතුරුවලට අනුව 2023 ට සාපේක්ෂව 2024 වර්ෂයේ,
(1) ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 50% සිට 48% දක්වා පහළ ගොස් ඇත.
(2) ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 48 % සිට 50% දක්වා ඉහළ ගොස් ඇත.
(3) සේවා නියුක්ති අනුපාතිකය 80% සිට 60% දක්වා ඉහළ ගොස් ඇත.
(4) සේවා වියුක්ති අනුපාතිකය 20% සිට 30% දක්වා ඉහළ ගොස් ඇත.
(5) ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 50% සිට 40% දක්වා පහළ ගොස් ඇත.

49. අස්වැසුම සුබ සාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මගින් අඩු ආදායම්ලාභී පවුල් ආරෝහණ පිළිවෙළට වර්ග කර ඇත්තේ,
(1) අන්ත දිළිඳු , දිළිඳු , අවදානමට ලක් වූ සහ සංක්‍රාන්ති ලෙස ය.
(2) දිළිඳු ,අන්ත දිළිඳු , සංක්‍රාන්ති හා අවදානමට ලක් වූ ලෙස ය.
(3) අවදානමට ලක් වූ , අන්ත දිළිඳු , දිළිඳු සහ සංක්‍රාන්ති ලෙස ය.
(4) සංක්‍රාන්ති , අවදානමට ලක් වූ , දිළිඳු සහ අන්ත දිළිඳු ලෙස ය.
(5) අන්ත දිළිඳු , දිළිඳු, සංක්‍රාන්ති සහ අවදානමට ලක් වූ ලෙස ය.

50. පැරිස් සමාජයට අයත් නොවන, ශ්‍රී ලංකාවේ ද්වි පාර්ශ්වීය ණය හිමියෙකු වන්නේ,
(1) කුවේට් ය. (2) ඇමරිකා එක්සත් ජනපදය ය. (3) එක්සත් රාජධානිය ය.
(4) කැනඩාව ය. (5) ජපානය ය.

≈≈≈≈≈≈≈≈≈

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2025
General Certificate of Education (Adv. Level) Examination, Practice Question Paper - 2025

**ආර්ථික විද්‍යාව II**
**Economics II**

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
**Additional Reading Time - 10 minutes**

**පැය තුනයි**
**Three hours**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න**

**උපදෙස් :**

- **‘ අ ‘**උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද **‘ආ’** උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## **‘අ’ උප කොටස**

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න)

**1.**


(i) **‘භූමිය’** සහ **‘ස්වභාවික ප්‍රාග්ධනය’** අතර වෙනස උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(ii) **“තේරීමේ ගැටලුව පැන නැගීමට එකම හේතුව සම්පත් හිඟකමයි.“** මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද යන්න සහේතුක ව දක්වන්න. (ලකුණු 02යි)


(iii) අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ දී **‘ව්‍යවසායකත්වය’** සහ **‘මානව ප්‍රාග්ධනය’** ප්‍රවර්ධනය කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරන්නේ ඇයි? ආර්ථික විද්‍යානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) **නිදහස් ව්‍යවසාය ආර්ථිකයක් විධානගත ආර්ථිකයකින්** වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(v) A සහ B යන රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර පහත දැක්වේ.




A රටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය




B රටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය

අ) A රට සහ B රට මුහුණ දෙන ආවස්ථික පිරිවැය ස්වරූපයන් දක්වන්න. (ලකුණු 02යි)

ආ) ඉහත ආකාරයේ ආවස්ථික පිරිවැය තත්ත්වයන් ඇති වීමට හේතු කවරේ ද? (ලකුණු 04යි)

**2.**

(i) භාණ්ඩයක **‘සැපයුම’** හා **‘සැපයුම් ප්‍රමාණය’** අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සාමාන්‍ය භාණ්ඩයක හා ගිෆන් භාණ්ඩයක මිල වෙනස් වන්නේ නම් ඉල්ලුම් ප්‍රමාණය හැසිරෙන ආකාරය ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) ඉහළ සිට පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් මත පහළට ගමන් කරන විට මිල ඉල්ලුම් නම්‍යතාව හැසිරෙන ආකාරය හා ඒ අනුව ව්‍යාපාරික අයභාරය හැසිරෙන ආකාරය රූප සටහනක් යොදා ගනිමින් විස්තර කරන්න. (ලකුණු 04යි)

(iv) ආදායම් ඉල්ලුම් නම්‍යතා සංකල්පය යොදා ගනිමින් සාමාන්‍ය භාණ්ඩ, බාල භාණ්ඩ සහ සුඛෝපභෝගී භාණ්ඩ නිර්වචනය කරන්න. (ලකුණු 04යි)

(v) තරගකාරී වෙළෙඳපොළක් සමතුලිත වන විට අවශ්‍යයෙන් ම දැකිය හැකි ලක්ෂණ කවරේ ද? (ලකුණු 04යි)

**3.**

(i) කිසියම් භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍රවලට අදාළ සමීකරණ පහත දී ඇත.

$Q_D$ = 700 – 5P $Q_s$ = -200 + 10P

(අ) ඉහත සඳහන භාණඩය මත රු.6 ක ඒකක බදදක් පැනවුව හොත් නව සමතුලිත මිල හා ප්‍රමාණය දක්වන්න. (ලකුණු 04යි)

(ආ) බද්දෙන් පසු අහිමි වන සුබ සාධනය (deadweight loss) දක්වන්න. (ලකුණු 04යි)

(ii) මෙම භාණ්ඩය මත රු.80 ක අවම මිලක් පනවා, අධි සැපයුම රජය මිල දී ගන්නේ යැයි සලකා,

(අ)අධි සැපයුම රජය මිලදී ගත් පසු පාරිභෝගික අතිරික්තයේ වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ආ) සමස්ත ශුභ සාධනයේ වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(iii) කෘෂි කාර්මික භාණ්ඩවල මිල නිතර උච්චාවචනයන් සිදුවේ. ඒවායේ මිල ස්ථායීකරණය උදෙසා රජය අනුගමනය කරන ක්‍රියාමාර්ග 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

**4.**

(i) තම නිවසේ ම කොටසක තමාගේ ම ප්‍රාග්ධනය යොදවා , පවත්වාගෙන යන සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක **ඍජු පිරිවැය** වර්ග දෙකක් හා **වක්‍ර පිරිවැය** වර්ග දෙකක් දක්වන්න. (ලකුණු 04යි)

(ii) **හීනවන ආන්තික ඵලදා නීතිය** යන්නෙන් කුමක් අදහස් වේද? දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ හීනවන ඵලදා නීතිය ක්‍රියාත්මක නොවෙන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) **ස්වාභාවික ඒකාධිකාරය** යන සංකල්පය විස්තර කරන්න. (ලකුණු 02යි)

(iv) පූර්ණ තරගකාරී ආයතනවල සැපයුම් වක්‍ර මගින් වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කරනුයේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) පූර්ණ තරගකාරී වෙළෙඳපොළක අඹ ගෙඩියක මිල රුපියල් 50ක් ලෙස තීරණය වී ඇත. අඹ වෙළෙඳපොළේ එක් සැපයුම්කරුවෙකුගේ සතියක තොරතුරු පහත දැක්වේ.

නිපදවා අලෙවි කරන අඹ ගෙඩි ගණන 250,

මුළු විචල්‍යය පිරිවැය රු.6250 ,

මුළු ස්ථාවර පිරිවැය රු.4750,

(අ) අඹ ගෙඩියක සාමාන්‍ය මුළු පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) සතියේ මුළු ලාභය කොපමණ ද ? (ලකුණු 02යි)

(ඇ) පවතින පිරිවැය තත්ත්වයේ කිසිදු වෙනසක් සිදු නොවූයේ නම්, මෙම ආයතනය වසා දැමීමට තීරණය කරනුයේ කුමන මිලට පහළ මිල ගණන් යටතේ ද? (ලකුණු 02යි)

**5.**

(i) පහත දැක්වෙන සිදුවීම් දළ දේශීය නිෂ්පාදිතයට බලපාන්නේ කෙසේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(අ) රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම.

(ආ) මධ්‍යම ආණ්ඩුවේ වියදමෙන් රට පුරා ධීවර වරාය සියයක් ඉදි කිරීම.

(ඇ) ජනතාව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම.

(ඈ) පෙර වර්ෂවල දී මිලදීගත් මෝටර් රථ මෙම වර්ෂය තුළ වෙනත් තැනැත්තන් වෙත අලෙවි කිරීම. (ලකුණු 04යි)

(ii) පහත දැක්වෙන ඒකක අයත් වන්නේ කවර ආයතනික අංශවලට ද?

(අ) මහජන බැංකුව

(ආ) සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

(ඈ) සිංහ සමාජය (ලකුණු 04යි)

(iii) ජාතික ගිණුම් සම්පාදනය මගින් ආර්ථිකයට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් දක්වන්න. (ලකුණු 02යි)

(iv) කල්පිත ආර්ථිකයක සාර්ව විචල්‍යන් පහත දැක්වේ.

C = 500 + 0.8yd, I = 600, G = 400, T = 200, Tr = 60

(සියලුම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි.)

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායමේ වටිනාකම කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) බදු සංගුණකය හා රාජ්‍ය වියදම් ගුණකයේ අගයන් කොපමණ ද? (ලකුණු 02යි)

(ඇ) මෙම ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම රුපියල් බිලියන 10000ක් වේ නම් එම මට්ටම දක්වා ළඟා වීමට රාජ්‍ය වියදම් කොපමණ වෙනස් කළ යුතු ද? (ලකුණු 02යි)

(v) පාරිභෝජන ශ්‍රිතයේ, **a** හා **byd** යන සංරචක අර්ථ දක්වන්න. (ලකුණු 04යි)

## ‘ආ’ උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න)

**6.**

(i) **ආසන්න මුදල්** සහ **මුදල් ආදේශක** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) **කොළඹ පාරිභෝගික මිල දර්ශකයට** සාපේක්ෂව **ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි** විශේෂ ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) **සංචිත මුදල් හා මුදල් ගුණකය** අර්ථ දක්වා, රටක සංචිත මුදල් ප්‍රමාණය තීරණය කරන සාධක පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(iv) පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමයේ සිට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමයකට යොමු වීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කර ඇත.

(අ) මහ බැංකුව හඳුන්වා දී ඇති ප්‍රධාන **මුදල් ප්‍රතිපත්ති උපකරණය** කුමක් ද? (ලකුණු 01යි)

(ආ) ප්‍රතිපත්ති පොළී අනුපාතිකය මගින් මුදල් සැපයුම ප්‍රසාරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 02යි)

(v) වාණිජ බැංකු පද්ධතියක රුපියල් මිලියන 5000 ක තැන්පතු පැවති අතර , එයින් රුපියල් මිලියන 1000ක් සංචිත ලෙස තබා ගැනීමට ද, රුපියල් මිලියන 1500 ක් සුරැකුම්පත් මිල දී ගැනීමට ද, රුපියල් මිලියන 2500 ක් ණය ලබාදීමට ද යොදවා තිබුණි. මහ බැංකුව නියම කළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 10%කි.

(අ) මෙම බැංකු පද්ධතිය අධි සංචිත ශූන්‍ය වන තෙක් ම ණය ප්‍රසාරණය කරයි නම්, අලුතින් ලබා දිය හැකි උපරිම ණය මුදල් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) අලුතින් ණය ලබාදීමෙන් පසු බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය දක්වන්න. (ලකුණු 03යි)

**7.**

(i) වෙළෙඳපොළ ක්‍රමය **‘ සෞඛ්‍ය සේවාව ‘** සැපයීමටත්, **‘ජාතික ආරක්ෂක සේවාව‘** නොසැපයීමටත් සංඥා සපයනුයේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) **“**වෙළෙඳපොළ අසමත්වීම් නිවැරදි කරනු පිණිස රජය සිදු කරන ඇතැම් මැදිහත්වීම් සඳහා ජනතා විරෝධය පැන නැඟෙන අවස්ථා සුලභව දක්නට ලැබේ**”**. මේ මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) පහත සංකල්ප අතර වෙනස දක්වන්න.

අ) අනුක්‍රමික බදු හා ප්‍රතික්‍රමික බදු

ආ) ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය (ලකුණු 04 යි)

(iv) අයවැය හිඟය පියවා ගැනීමට රජය භාවිත කරන උපකරණ හා මාර්ග කවරේ ද? (ලකුණු 04යි)

(v) රාජ්‍ය ආදායම් ඉහළ නංවා ගැනීමට 2025 වර්ෂය සඳහා කරනු ලැබූ යෝජනා සඳහන් කරන්න. (ලකුණු 04යි)

**8.** සියලු සම්පත් භාවිතයට ගනිමින් ඇමරිකාව හා ජපානය යන රටවල් දෙකෙහි රෙදි හා රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ හැකියාව පහත දැක්වේ.

| රට | රෙදි නිමැවුම (ඒකක) | රූපවාහිනී නිමැවුම (ඒකක) |
|---|---|---|
| ඇමරිකාව | 10000 | 10000 |
| ජපානය | 20000 | 10000 |

(i) ඉහත තොරතුරු අනුව එක් එක් රට රෙදි හා රූපවාහිනී යන භාණ්ඩ අතුරින් විශේෂීකරණයට ලක් කරන්නේ කුමන භාණ්ඩ ද ? (ලකුණු 04යි)

(ii) විශේෂීකරණයට පසු රටවල් විදේශ වෙළෙඳාමට අවතීර්ණ වන බව සලකන්න. එම රටවල් දෙකෙහි පරිභෝජන හැකියා මායිම්, නිෂ්පාදන හැකියා මායිම් අභිබවා යන බව රූප සටහන් මගින් පෙන්වා දෙන්න. මෙහි දී ඇමරිකාව රූපවාහිනී 5000 ක් අපනයනය කර, රෙදි මීටර් 8,000 ක් ආනයනය කරන බව සලකන්න. (ලකුණු 06යි)

(iii) ශ්‍රී ලංකාව වර්තමානයේ කලාපීය සහ ද්විපාර්ශ්වීය වශයෙන් පවත්වාගෙන යන නිදහස් වෙළෙඳ ගිවිසුම් කවරේ ද? (ලකුණු 04යි)

(iv) ඇමරිකානු ඩොලරයේ රුපියල් මිල තීරණය වන ආකාරය පෙන්නුම් කිරීමට උචිත ප්‍රස්තාර සටහනක් අඳින්න. මෙම විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඉල්ලුම් වක්‍රය පහළට සහ සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

**9.**

(i) ආර්ථික සංවර්ධනය හා තිරසාර සංවර්ධනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) සංවර්ධනය මැනීමෙහි ලා මානව සංවර්ධන දර්ශකයේ දක්නට ලැබෙන ප්‍රබලතා හා සහ දුබලතා පරීක්ෂා කරන්න. (ලකුණු 04යි)

(iii) (අ) දරිද්‍රතා රේඛාව සහ ජනගහන දරිද්‍රතා දර්ශකය අතර වෙනස කුමක් ද? (ලකුණු 02යි)

(ආ) බහුමාන දරිද්‍රතාව මිනුම් කිරීමේ දී සැලකිල්ලට ගන්නා පැතිකඩ දක්වා, එය මිනුම් කිරීමට ශ්‍රී ලංකාව භාවිතයට ගන්නා දර්ශක දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)

(iv) ශ්‍රී ලංකාවේ වැඩ කළ හැකි වයසේ ජනගහනය හා ශ්‍රම බලකාය අතර අනුපාතිකය මගින් අනාවරණය වන්නේ කුමක් ද? හේතු දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය සඳහා ඇති සමාජ ආරක්ෂණ ජාල කවරේ ද? එම ජාල කෙරෙහි ප්‍රජා විද්‍යාත්මක වෙනස්කම් මගින් එල්ල කරන අභියෝග කවරේ ද? (ලකුණු 04යි)

**10.**

(i) 2020 දී ආසියානු සංවිධානය හා එහි වෙළෙඳ හවුල්කරුවන් එක්ව ගොඩනගා ගත් **'කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරීත්වය'**හි සාමාජික රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04යි)

(ii) ශ්‍රී ලංකාව ඉහළ තරගකාරීත්වයක් සහිත අපනයනාභිමුඛ ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කර ගැනීම මූලික අරමුණ කරගත් ආර්ථික පරිවර්තන පනතේ අරමුණු කවරේ ද? (ලකුණු 05යි)

(iii) නිදහස ලබා සියවසක් සපුරනවිටවත් සංවර්ධිත රටක් බවට පත්වීමේ ඉලක්කය වෙත ළඟා වීමට ශ්‍රී ලංකා ආර්ථිකය ජයගත යුතු අභියෝග කවරේ ද? (ලකුණු 05යි)

(iv) ශ්‍රී ලංකා රජය, 2025 – 2029 මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුව ණය තිරසාරභාව සපුරා ගැනීම සඳහා සැලසුම් කර ඇති රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මොනවා ද? (ලකුණු 06යි)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2025

# General Certificate of Education (Adv. Level) Examination, Practice Question Paper - 2025

## උත්තර පත්‍රය, Answer Sheet

## ආර්ථික විද්‍යාව I

## Economics I

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 5 | 21. | 1 | 31. | 5 | 41. | 2 |
| 02. | 4 | 12. | 2 | 22. | 1 | 32. | 2 | 42. | 3 |
| 03. | 2 | 13. | 2 | 23. | 3 | 33. | 4 | 43. | 1 |
| 04. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 1 | 44. | 5 |
| 05. | 4 | 15. | 4 | 25. | 4 | 35. | 1 | 45. | 4 |
| 06. | 3 | 16. | 3 | 26. | 1 | 36. | 4 | 46. | 2 |
| 07. | 5 | 17. | 4 | 27. | 4 | 37. | 2 | 47. | 5 |
| 08. | 3 | 18. | 4 | 28. | 2 | 38. | 3 | 48. | 1 |
| 09. | 1 | 19. | 1 | 29. | 1 | 39. | 5 | 49. | 4 |
| 10. | 2 | 20. | 4 | 30. | 2 | 40. | 4 | 50. | 1 |